ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
අංක. 15/5, බලද්‍රක්ෂ මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව.
இல. 15/5, பாலதக்ஷ மாவத்தை, கொழும்பு 03, இலங்கை.
No. 15/5, Baladaksha Mawatha, Colombo 03, Sri Lanka. Website : www.defence.lk

[redacted]

මගේ අංකය / My No }

ඔබේ අංකය / உமது இல / Your No }

තැ. පෙ. / த. பெ. / P.O. Box } 572
දුරකථන / தொலைபேசி / Telephone } 2430860-9 / 2430870-8
ලේකම් / செயலாளர் / Secretary } දුර./தொலை./Tel. : 011 2381154 / ෆැක්ස්/தொ./Fax.: 011 2541529 / වි. තැපැල/மி.அ./Email : secdefence@defence.lk

දිනය / திகதி / Date } 2021. 02. 18 -


අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය : MOD/CP/PAC/05/2021

<u>අමාත්‍ය මණ්ඩල සංදේශය</u>

<u>ප්‍රමුඛත්වය මත ක්‍රියාත්මක කළ යුතු ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ යෝජනා</u>

1.0 **පසුබිම**

1.1 2019 අප්‍රේල් මස 21 වන දින සිදු වූ පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසු රට හමුවේ ගොඩනැගුණු ප්‍රශ්නකාරී සහ වියවුල් සහගත තත්ත්වයට පිළියම් ලෙස එතෙක් ක්‍රියාත්මකව තිබූ මූලික නීති පද්ධතියෙහි යම් සංශෝධන සහ වෙනස්කම් සිදුවිය යුතු බව දන්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසක් විසින් ලබාදුන් මූලික යෝජනාවලියක් මුල් කර ගනිමින් 2019 මැයි මස 17 වන දින ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මලිත් ජයතිලක මහතාගේ සභාපතිත්වයෙන් සෙසු පාර්ලිමේන්තු මන්ත්‍රී සාමාජිකයින් 16 දෙනෙකුගෙන් සමන්විත ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව රැස්වී ඇත. එමගින් 'එක රටක් - එක නීතියක්' යන පදනම මත ශ්‍රී ලංකාවේ ජාතීන් හා ආගම් අතර මිත්‍රත්වය වර්ධනය කරවමින් 'නව ත්‍රස්තවාදය හා අන්තවාදය' මුලින් උපුටා දැමීමට අවශ්‍ය වන පරිදි ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට අදාළ නීතිරීති සම්පාදනය සහ එම නීතිරීති ක්‍රියාත්මක කරවීම සඳහා කාරක සභාවේ යෝජනා සහ නිර්දේශ ඇතුලත් වාර්තාව 2020 පෙබරවාරි මස 19 වන බදාදා දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 111 යටතේ ආංශික අධීක්ෂණ කාරක සභාවක් සතු බලතල සහ ක්‍රියාකාරීත්වය අනුකූලව ඉදිරිපත් කර ඇත.

1.2 මෙම යෝජනා සහිත වාර්තාවෙහි මුඛ්‍ය අර්ථය ලෙස රට තුල ජීවත්වන සියලු පුරවැසියන්ගේ අභිලාෂයන් සපිරෙන පරිදි රටේ ජාතික ආරක්ෂාව පළමුව තහවුරු කිරීමත් සිංහල, දෙමළ සහ මුස්ලිම් ඇතුළු සියලු ජනවර්ග එක්කල නූතන ශ්‍රී ලාංකීය ජාතියක් : අන්තර් ආගමික, අන්තර් වාර්ගික ආකල්පයන්ගෙන් යුත් ශ්‍රී ලාංකීය සමාජයට අනුගත වූ, සමාජ සංස්කෘතිය, සභ්‍යත්වය සහ දේශීය හර පද්ධතිය මුල් කොට ගත් 'ශ්‍රී ලාංකිකත්වය යනු තම පළමු අනන්‍යතාවය' ලෙස සලකන, 'ශ්‍රී ලාංකීය සිංහල, ශ්‍රී ලාංකීය දෙමළ සහ ශ්‍රී ලාංකීය මුස්ලිම්' යනුවෙන් සිතන ජනතාවක් සිටින ශ්‍රී ලංකාවක් ගොඩනැගීම සඳහා අවශ්‍ය පසුබිම සම්පාදනය කිරීම දක්වා ඇත.

1.3 ඒ සඳහා මෙම්‍යාන්තරයට මගින් ජාතික ආරක්ෂණ ව්‍යුහයන් ශක්තිමත් කිරීම, [illegible] පැතිරයාම වැළැක්වීම, ත්‍රස්තවාදයට අනුබල දෙන මූල්‍ය සම්පාදනය මැඩලීම, අවදානම් තත්ත්වයන්ට ක්ෂණික ප්‍රතිචාර දැක්වීමේ [illegible] කිරීම, ආවේක්ෂණ (Surveillance) ශක්‍යතා ප්‍රවර්ධනය, අවදානම් පුරෝකථනය සහ මැඩලීම පිණිස සන්නිවේදන තාක්ෂණික සහ දත්ත විද්‍යාත්මක (ICT and Data Science) [illegible] වර්ධනය, ජාතික සහ ජාත්‍යන්තර නව

ත්‍රස්තවාදී අභියෝග පිළිබඳව ඇති අධ්‍යයනයන්, අත්දැකීම් සහ දැනුම වර්ධනය, අන්තවාදයට ආධාරක විය හැකි ආයතනික සහ පුද්ගල අභියෝග මර්දනය සමඟ අන්තර් වාර්ගික සහ අන්තර් සාමයික අනවබෝධය සහ සැකය දුරු කිරීම ඉලක්ක කරගත් වැඩසටහන් ආදී සාර්ව ප්‍රවේශයක් යටතේ නිර්දේශ ඉදිරිපත් කර ඇත.

1.4 ඒ අනුව ශ්‍රී ලංකාව නූතන සංවර්ධිත රාජ්‍යයක් ලෙස ගොඩනැගීමේදී ජාතික ආරක්ෂාව සඳහා එල්ල වූ අභියෝග සහ ඉදිරියේදී එල්ලවිය හැකි දේශීය සහ විදේශීය තර්ජන සඳහා සාර්ථකව මුහුණදීමට මෙරට රාජ්‍ය තාන්ත්‍රිකභාවය, තොරතුරු, ආරක්ෂක ප්‍රතිපත්ති සහ ආර්ථිකය විධිමත්ව සහ ශක්තිමත්ව පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා ශ්‍රී ලංකාව විදේශීය බලවේගයන්හි ගොදුරක් නොවන පරිදි සියලු ශ්‍රී ලාංකිකයින්ගේ සබැඳියාවෙන් එකම ජාතික අනන්‍යතාවයකින් යුතුව සමෘද්ධිමත්, සෞභාග්‍යමත් සහ සාර්ථක දේශයක් වශයෙන් පවත්වාගෙන යාම සියලු ශ්‍රී ලාංකිකයින්ගේ අපේක්ෂාවයි. ඊට අදාළව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ යෝජනා සහ නිර්දේශ ඇතුලත් වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇති ඉතා සාධනීය යෝජනාවන් 2020 නොවැම්බර් මස 03 වන දින ජනාධිපති කාර්යාලයේදී පැවැත්වූ ජාතික ආරක්ෂක කවුන්සිලයේදී සාකච්ඡාවට බඳුන් කරන ලදී.

## 2.0 යෝජනාව

පාස්කු ඉරුදින ප්‍රහාරය වැනි සිදුවීමක් නැවත ඇති නොවීම සඳහා පහත දැක්වෙන අරමුණු පදනම් කරගෙන ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ නිර්දේශ අතරින් ප්‍රමුඛතා පදනම මත ක්‍රියාත්මක කළ යුතු නිර්දේශ ඇමුණුම 'අ' හි දැක්වේ.

අ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම.

ආ. ශ්‍රී ලංකාවේ දේශසීමා ආරක්ෂාව හා ජාතික ආරක්ෂාව තහවුරු කිරීම.

ඇ. සෑම දරුවකුටම යහපත් ශ්‍රී ලාංකික පුරවැසියෙකු වශයෙන් සංතෘප්ත ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය ආකල්ප සහ නිපුණතා වර්ධනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ව්‍යුහය තුල ලබා දීමේ වගකීම.

ඈ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික මිනිස් අයිතිවාසිකම් සහ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුව ළමා හා කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

ඉ. අනන්‍යතාවය හඳුනාගත නොහැකි මුහුණු ආවරණ භාවිතය ආරක්ෂාවට තර්ජනයක් වීම වැළැක්වීම.

උ. ප්‍රධාන ධාරාවේ සම්ප්‍රදායික මුස්ලිම් පල්ලි වලට අමතරව විවිධ අන්තවාදී පල්ලි ඉදිකිරීම තහනම් කිරීම, ආගමික අන්තවාදයට ආධාර කරන විදේශ සංවිධාන හා රටවල් හරහා ලැබෙන අරමුදල් යොදවා අන්තවාදය පතුරවන මුස්ලිම් පල්ලි ප්‍රවර්ධනය වැළැක්වීම සහ අවශ්‍ය සම්ප්‍රදායික පල්ලි ප්‍රමාණය පවත්වා ගැනීම / නියාමනය.

ඌ. මුස්ලිම් ජනතාව ප්‍රධාන සමාජ ධාරාවෙන් වෙන් කිරීමට අන්තවාදී කොටස් දරණ උත්සාහයන් ව්‍යර්ථ කිරීම හා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයන් සමඟ අන්තවාදී කණ්ඩායම් මුහු කිරීම.

එ. ඉස්ලාම් අන්තවාදී ආගමික ඉගැන්වීම් පිටුදැකීම, ළමුන්ගේ මනස අන්තවාදයට යොමු කිරීම වැළැක්වීම හා ළමා කාලය ප්‍රීතිමත්ව හා අන්‍යජාතීන් සමඟ සහයෝගයෙන් ජීවත්වීමට ශ්‍රීලාංකික දරුවන්ට ඉගැන්වීම.

ඒ. අන්තවාදීන් විසින් සයිබර් අවකාශය, සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණය භාවිතයෙන් අන්තවාදය ප්‍රවර්ධනය කිරීම, සාමාජිකයින් බඳවා ගැනීම, ප්‍රහාර සැළසුම් කිරීම සහ අරමුදල් රැස්කිරීම් වැනි ක්‍රියාකාරකම් වැළැක්වීම හා එයට අවශ්‍ය වන තාක්ෂණික සාක්ෂරතාව කුඩා කල පටන් දරුවන් වෙත ලබා දීම.

ඔ. ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකා රාජ්‍යයට එරෙහිව විවිධ විදේශ රාජ්‍යයන්ගේ අතකොළු ලෙස එම අරමුදල් මත ක්‍රියාකරන දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන මගින් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට මුවාවී සිදුකරන අන්තවාදී සහ රාජ්‍ය විරෝධී ක්‍රියා වැළැක්වීම.

ඕ. රාජ්‍ය නොවන සංවිධාන වල කර්තව්‍යයන් රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් නොවන බව හා ඔවුන්ගේ සංවිධාන වල ප්‍රකාශිත අරමුණු ඉක්මවා ඒවා ක්‍රියාත්මක නොවන බව තහවුරු කිරීම.

ක. ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ හරහා බහුතර බලයක් සහිතව පත්වන රජයන් මගින් පොදු ජනතා අරමුණු ඉෂ්ඨ කර ගැනීම සහ අන්තවාදී අරමුණු ඉටු කර ගැනීමට පාර්ලිමේන්තු වරප්‍රසාද හෝ ක්‍රමවේද භාවිතා කිරීම වැළැක්වීම.

ග. සාවද්‍ය තොරතුරු ජනගත කර ජාතීන් අතර අසමගිය අවුලවා අන්තවාදීන්හට ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයට එරෙහිව ක්‍රියාකිරීමට පරිසරය සැකසීම වැළැක්වීම.

ච. මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ විනිවිදභාවය පවත්වා ගැනීම.

ජ. ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය තුල කටයුතු කිරීමට හැකි ආගමික ස්වරූපයෙන් තොර මුස්ලිම් සිවිල් හා ස්වේච්ඡා සංවිධාන බලාත්මක කිරීම මගින් සාමය සහජීවනය පවත්වා ගැනීම.

ට. ශ්‍රී ලංකාවේ ඓතිහාසික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරමින් සියලු ජනවර්ග අතර සංහිඳියාව තහවුරු කිරීම.

ඩ. එක් ජන කොටසකට අයත් ආගමික නිදහස අනෙකුත් ආගම් වලට හානියක් නොවන සේ භුක්ති විඳීම තහවුරු කිරීම සහ අන්තවාදීන් එමගින් දේශපාලන වාසි ලබාගෙන අන්‍ය ආගමිකයන්ට එරෙහිව ක්‍රියාකිරීම වැළැක්වීම.

ත. එක් ආගමික කොට්ඨාසයකට පමණක් අදාළ වන හලාල් වැනි සහතික බහුතර ජනතාව මත බලයෙන් පැටවීම වැළැක්වීම.

ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් ඉදිරිපත් කර ඇති ඇමුණුම 'අ' හි ඇතුලත් නිර්දේශ ඒ ඒ අදාළ රේඛීය අමාත්‍යාංශ මගින් ක්‍රියාත්මක කරවීම සුදුසුයැයි යෝජනා කරමි. එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ඒවාට පසුබිම් වූ ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාවේ සඳහන් අනුශාංගික කරුණු ද සුදුසු පරිදි යොදා ගැනීම යෝග්‍ය වේ.

## 3.0 අනුමැතිය

පහත දැක්වෙන කරුණු සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරමි.

3.1 ඡේද අංක 2.0 හි යෝජනා කර ඇති පරිදි ඒ ඒ අමාත්‍යාංශ වෙතින් ක්‍රියාත්මක කිරීමට ඇති නිර්දේශයන් අදාළ අමාත්‍යාංශ වෙතින් ක්‍රියාත්මක කරවීම.

3.2 එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී ඒවාට පසුබිම් වූ ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාවේ සඳහන් අනුශාංගික කරුණු ද සුදුසු පරිදි යොදා ගැනීම.

**ගෝඨාභය රාජපක්ෂ**
ජනාධිපති හා ආරක්ෂක අමාත්‍ය

**ප්‍රමුඛත්වය මත ක්‍රියාත්මක කළ යුතු ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ යෝජනා**

| අංකය | යෝජනාව | වගකීම දරන ආයතනය |
|---|---|---|
| | **ඉදිරි මාස 03 ඇතුළත කඩිනමින් ආරම්භ කළ යුතු** | |
| 1 | මදුසා උපරිම සංඛ්‍යාව 50 කට සීමා කිරීම - අතිරික්ත සිසුන් 2023 වන විට පොදු අධ්‍යාපන ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම. | බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය හා අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් |
| 2 | ඉස්ලාම් මවුලවිවරුන් පුහුණු කරන අධ්‍යාපන ආයතන ලෙස සළකා මදුසා පවත්වාගෙන යාම - ඇතුලත් වීමේ වයස අවුරුදු 16 කිරීම. | |
| 3 | මක්තබ් ඉගැන්වීම් ක්‍රියාවලිය අහෝසි කිරීම. | |
| 4 | රජයේ පාසල් වල ඉස්ලාම් පෙළපොත් සංස්කරණ කිරීමට පිළිගත් විද්වත් කමිටුවක් පත් කිරීම. ඒවාට අන්තවාදී ආගමික අදහස් ඇතුළුවීම වැළැක්වීම. | |
| 5 | අන්තවාදී මුස්ලිම් ප්‍රජාව රැඩිකල්හරණය කිරීම. (De-radicalization) | ආරක්ෂක අමාත්‍යාංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය, බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය |
| 6 | සමාජ සංහිඳියාවට එරෙහි අපරාධ නිර්වචනය කිරීම පිණිස අපරාධ නඩු විධාන සංග්‍රහයේ 120, 291 වගන්ති සංශෝධනය කිරීම හා දණ්ඩ නීති සංග්‍රහයේ 282අ වගන්තිය (ප්‍රසිද්ධ ස්ථානයකදී සම්පූර්ණයෙන් මුහුණු ආවරණය තහනම් කිරීම) ආදේශ කිරීම. | අධිකරණ අමාත්‍යාංශය |
| 7 | වයස අවුරුදු 18 ට අඩු විවාහ තහනම් වන පරිදි පාර්ශව 02 ටම විවාහයේ නෛතික අයිතිය ලැබෙන පරිදි හා දික්කසාදය සාමාන්‍ය නීතිය යටතේ සිදුකල හැකි වන පරිදි මුස්ලිම් විවාහ හා දික්කසාද නීතිය සංශෝධනය කිරීම. (මුස්ලිම් නීතිය සම්පූර්ණයෙන් අහෝසි කරන තෙක්) | අධිකරණ අමාත්‍යාංශය |
| 8 | ජාතික සයිබර් ආරක්ෂණ පනතක් (National Cyber Security Act) සම්පාදනය හා 2007 අංක 24 දරණ සයිබර් අපරාධ පනත සංශෝධනය. | තාක්ෂණ අමාත්‍යාංශය - ICTA - TRCSL |
| 9 | විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පනත සංශෝධනය. | |



රහසය

| අංකය | යෝජනාව | වගකීම දරන ආයතනය |
|---|---|---|
| 10 | සෑම දරුවකුටම පොදු අධ්‍යාපනය වයස අවුරුදු 16 සම්පූර්ණ වනතුරු අනිවාර්ය කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 11 | සම්ප්‍රදායික මුස්ලිම් පල්ලි වලින් පරිබාහිර සියළු පල්ලි වලට මුදල් ලැබෙන ප්‍රභවයන් පිළිබඳව පූර්ණ විගණනයක් කිරීම. | රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, වකුෆ් සභාව |
| 12 | රාජ්‍ය නොවන සංවිධාන හා වෙනත් ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කිරීම. එසේ නොමැතිව ක්‍රියාත්මක වන සංවිධාන නීති විරෝධී ලෙස නම් කිරීම හා ඒවාට ලබා දෙන දඬුවම් නිර්වචනය කිරීම. | ආරක්ෂක අමාත්‍යාංශය |
| 13 | රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව සංශෝධිත පනත් කෙටුම්පතේ ඇතුලත් "හදිසි අවස්ථාවන්හිදී රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය" යන වගන්තිය ඉවත් කර අදාල ගැසට් නිවේදනය නිකුත් කිරීම. | |
| 14 | ශ්‍රී ලංකාවට රාජ්‍ය නොවන සංවිධාන ඔස්සේ ලැබෙන සියළු විදේශ අරමුදල් හා ආධාර නියාමනය කිරීමට අදාළ ලේකම් කාර්යාලය, CNI හා මහ බැංකුවේ FIU එක් කළ යාන්ත්‍රණයක් ගොඩ නැගීම. | ආරක්ෂක අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව |
| 15 | රාජ්‍ය නොවන ලේකම් කාර්යාලය යටතේ පනතක් ස්ථාපිත කොට රට තුලට ලැබෙන විදේශ ආධාර සියල්ල නිසි විගණනයකට ලක් කිරීම හා එම මුදල් සමාජයේ සියළු ජන කොටස් වලට පොදු ප්‍රතිලාභ ලැබෙන පරිදි යෙදවෙන බවට සහතික කිරීම නියාමනය. | ආරක්ෂක අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය |
| 16 | පෞද්ගලික මන්ත්‍රී යෝජනා ලෙස පාර්ලිමේන්තුවට ගෙන එන පනත් මගින් එක් ජනවර්ගයකට හෝ ආගමික කණ්ඩායමකට පමණක් ප්‍රතිලාභ අත්වන පදනම්, භාර, අරමුදල් හා සංවිධාන නීතිගත කිරීමට නොහැකි වන පරිදි පාර්ලිමේන්තු ස්ථාවර නියෝග සංශෝධනය කිරීම. | පාර්ලිමේන්තු මන්ත්‍රී යෝජනාවක් මගින් |
| 17 | විද්‍යුත්, මුද්‍රිත, සමාජ මාධ්‍ය සඳහා ස්වාධීන කොමිෂන් සභාවක් පිහිටුවන තෙක් අදාල ආයතන සාමූහිකව සම්බන්ධ වන අන්තර් වාර කමිටුවක් ස්ථාපනය කිරීම හා ජාතික ආරක්ෂාවට තර්ජනයක් හෝ සාමය හා සංහිඳියාව අනතුරේ හෙලන ප්‍රවෘත්ති ගලායාම නිරීක්ෂණය සඳහා ඒකාබද්ධ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. | ආරක්ෂක අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| 18 | ආගමන විගමන දෙපාර්තමේන්තුව සඳහා නවීන තාක්ෂණය ලබා දී එය ආරක්ෂක අමාත්‍යාංශය හා අනෙකුත් ආයතන සමඟ ජාලගත කිරීම. | රාජ්‍ය ආරක්ෂක. ස්වදේශ කටයුතු හා ආපදා කළමණාකරණ රාජ්‍ය අමාත්‍යාංශය |



රහසා

| අංකය | යෝජනාව | වගකීම දරන ආයතනය |
|---|---|---|
| 19 | නව ආගමන හා විගමන පනත් කෙටුම්පත නීතිගත කිරීම. (2018 වර්ෂයේ කෙටුම්පතකි) පළමුව යාවත්කාලීන විය යුතුය. | රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමණාකරණ රාජ්‍ය අමාත්‍යාංශය |
| 20 | ඒකාබද්ධ ප්‍රත්‍යන්ත පාලන පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට ඇති ආයතනික බාධක හා අපහසුතා සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන එය ඉක්මනින් ක්‍රියාවට නැංවීම. | ආරක්ෂක අමාත්‍යාංශය, ආගමන විගමන දෙපාර්තමේන්තුව |
| 21 | ජාතික ආරක්ෂක ප්‍රතිපත්තියක් (National Security Policy) සම්පාදනය. | ආරක්ෂක කවුන්සිලයේ මූලිකත්වයෙන් |
| 22 | ජාතික බුද්ධි පනතක් (National Intelligence Act) සම්පාදනය. | |
| 23 | වකුෆ් පනත යෝජිත පරිදි සංශෝධනය කිරීම. (ප්‍රධාන ධාරාවට අමතරව විවිධ මතවාද මත අලුතින් ඉදිවන පල්ලි නීති විරෝධී බව හඳුනාගෙන ප්‍රකාශ කිරීම හා ශ්‍රී ලංකාවේ ආවේණික ඉස්ලාමයට නොගැළපෙන මතවාද ප්‍රචාරය කරන සියළු පල්ලි ඉවත් කිරීමද, දැනට රට තුළ පල්ලි අවශ්‍ය ප්‍රමාණයට තිබෙන බැවින් නව පල්ලි ඉදිකිරීම අනවශ්‍ය බවද වකුෆ් සභාවේ මතය වී ඇත) | බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය |
| 24 | වංචනික, සාපරාධී, ත්‍රස්තවාදී ක්‍රියා සඳහා යොදාගත් දුරකථන අංක අසාදු ලේඛණගත කිරීම හා යලි නිකුත් කිරීමෙන් වැළකීම. | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 25 | දැනට පවත්නා ජංගම හා ස්ථාවර දුරකථන සේවා සම්බන්ධතා පිළිබඳ විගණනයක් TRCSL වෙතින් සිදු කිරීම. | TRCSL |
| 26 | ජාතික ආරක්ෂාවට සම්බන්ධ පරීක්ෂණයක් සිදු කරන රාජ්‍ය ආයතන වල භාවිතය සඳහා සෑම ජංගම හා ස්ථාවර දුරකථන සේවා සම්පාදක ආයතනයක් විසින්ම තොරතුරු හා දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම. | |
| 27 | ශ්‍රී ලාංකීය මුස්ලිම් සංකල්පය සන්නිවේදනය කෙරෙන වැඩසටහන් ප්‍රචාරය කිරීම හා මුස්ලිම් දේශපාලන පක්ෂ නායකයන් හා විද්වතුන් මුස්ලිම් ජන සමාජයට පමණක් බලපාන ප්‍රශ්න පිළිබඳ පෙනී සිටීම වෙනුවට රටේ පොදු ප්‍රශ්න වෙනුවෙන් පෙනී සිටීමේ වැදගත්කම පෙන්වන කතිකාවතක් ජනමාධ්‍ය මගින් නිර්මාණය කිරීම. | ජනමාධ්‍ය අමාත්‍යාංශය |

| අංකය | යෝජනාව | වගකීම දරන ආයතනය |
|---|---|---|
| | ඉදිරි මාස 06 තුළ ක්‍රියාවට නැංවිය යුතු | |
| 28 | සියළු පොදු අධ්‍යාපන ආයතන වල විෂය මාලා ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමැතියට යටත් කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 29 | වයස අවුරුදු 05 සම්පූර්ණ වන විට සෑම දරුවකුම පාසලට යැවීම, සියළු පාසැල් වල පාසල් වර්ෂය ආරම්භය, අවසානය, නිවාඩු කාල එකම දර්ශනයකට ගෙන ඒම, අන්තවාදය පිටු දැකීමට අවශ්‍ය විශේෂ පුහුණුව තෝරාගත් අධ්‍යාපන පරිපාලකයින්ට, විදුහල්පතිවරුන්ට, ගුරුවරුන්ට ලබාදීම. | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 30 | මුස්ලිම් කටයුතු අමාත්‍යාංශයේ හා මුස්ලිම් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සේවක මණ්ඩලය වාර්ගික සම්මිශ්‍රණයක් සහිතව පත් කිරීම. | බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය සේවා හා පළාත් පාලන අමාත්‍යාංශය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 31 | ආගමික ස්වරූපයෙන් බැහැර විය හැකි වන පරිදි මුස්ලිම් හා ස්වේච්ඡා සංවිධාන බල ගැන්වීම. | ආරක්ෂක අමාත්‍යාංශය, රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය |
| 32 | සාමාන්‍ය මුස්ලිම් ජනතාව යොදාගෙන, ඔවුන්ට දෛනිකව බලපාන පාරිසරික හා සමාජ ප්‍රශ්න ඉලක්ක කර ගත් සිවිල් සංවිධාන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මුල් කර ගෙන ගොඩනැගීම. (උදා: කසළ කළමණාකරණය) | |
| 33 | ජාත්‍යන්තර පාසල් අධීක්ෂණය හා නියාමන බලතල අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරීම. ( අධ්‍යාපන උපනෑත පනත් සංශෝධනය) නව ජාත්‍යන්තර පාසල් ආරම්භය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සිදු කිරීමට පනතක් සම්මත කිරීම, එම පාසල් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම හා පාසල් බලපත්‍ර වාර්ෂිකව යාවත්කාලීන කිරීම. | ජනාධිපති ලේකම් කාර්යාලය, ආයෝජන මණ්ඩලය හා අධ්‍යාපන අමාත්‍යාංශය |
| 34 | මුස්ලිම් පාසල් දරුවන්ගේ විෂය මාලාවට සිවිල් සමාජ සංවිධාන වල ඇති වැදගත්කම පිලිබඳ නිර්දේශිත ග්‍රන්ථයන් හඳුන්වා දීම. | අධ්‍යාපන අමාත්‍යාංශය, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව |
| 35 | සෑම පොලිස් ස්ථානයක් සඳහාම සයිබර් ආරක්ෂණ නිලධාරියෙකු පත් කිරීම. | පොලිස් දෙපාර්තමේන්තුව |
| 36 | විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් හා ප්‍රවෘත්ති ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් නිරීක්ෂණය කර වාර්ෂික වාර්තාවක් සම්පාදනය කිරීම. ඔවුන්ගේ වාර්ෂික බලපත්‍ර යාවත්කාලීන කිරීමේ දී එය සැලකීම. | ජනමාධ්‍ය අමාත්‍යාංශය |


රහස්‍ය

| අංකය | යෝජනාව | වගකීම දරන ආයතනය |
|---|---|---|
| 37 | පුවත් වෙබ් අඩවි ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය නෛතික රාමුවක් යටතට ගැනීම හා ආචාර ධර්ම මාලාවක් ස්ථාපනය. | ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| 38 | සමාජ මාධ්‍ය සඳහා සහයෝගී නියාමන ( Co-Regulating ) ක්‍රමවේදයක් හඳුන්වා දීම. | |
| 39 | විද්‍යුත්, මුද්‍රිත හා සමාජ මාධ්‍ය නියාමනය සඳහා වන ස්වාධීන කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම. | ජනමාධ්‍ය අමාත්‍යාවරයා ඉදිරිපත් කරන පනත් කෙටුම්පතක් මගින් |
| 40 | වර්ෂ 1981 දරන ජනමාධ්‍ය වේදීන්ගේ ආචාර ධර්ම පද්ධතිය යාවත්කාලීන කිරීම. | ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| 41 | විද්‍යුත් මාධ්‍ය සඳහා ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම. | |
| 42 | විද්‍යුත් මාධ්‍ය වෘත්තිකයන්ගේ සංසදයක් පිහිටුවීම. | |

| ඉදිරි වසර තුළ ක්‍රියාවට නැංවිය යුතු | | |
|---|---|---|
| 43 | පාසල් අධ්‍යාපන ක්‍රියාවලියට සුරක්ෂිත අන්තර් ජාල භාවිතය , සයිබර් ආරක්ෂාව, සයිබර් අපරාධ හා මූලික මාධ්‍ය සාක්ෂරතාවය ඇතුළත් කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 44 | අන්තවාදයේ ඇති නිස්සාර බව හා එය මුස්ලිම් ජන සමාජයට සිදු කරන අනර්ථය පිළිබඳව ජාත්‍යන්තර විද්වත් දේශකයින්ගේ ප්‍රසිද්ධ දේශන, මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් සංවිධානය කිරීම. | බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |
| 45 | රාජ්‍ය ප්‍රතිපත්තියක් වශයෙන්, රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ලේකම් කාර්යාලය සමාජ සේවා හෝ ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුලත් කිරීම. | ජනාධිපති ලේකම් කාර්යාලය |
| 46 | එක් ජන වර්ගයක් හෝ ආගමික කණ්ඩායමක් අරමුණු කරගෙන පිහිටුවා තිබෙන හෝ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වන ආකාරයේ අභිමාර්ථ ඇතුලත් ව්‍යවස්ථා සහිත දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම තහනම් කල හැකි වන පරිදි 1981 අංක 01 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත සංශෝධනය කිරීම. | ජනාධිපති ලේකම් කාර්යාලය, මැතිවරණ කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව |

| අංකය | යෝජනාව | වගකීම දරන ආයතනය |
|---|---|---|
| 47 | මෙවන විට ලියාපදිංචි කර ඇති පක්ෂ හෝ ඒවායේ ව්‍යවස්ථා තුල ඉහත සඳහන් තත්ත්වයන් තිබේ නම් ඒවා නිවැරදි කර ගැනීමට නිශ්චිත කාල රාමුවක් මැතිවරණ කොමිෂන් සභාව විසින් ලබා දීම. | මැතිවරණ කොමිෂන් සභාව |
| 48 | ඉහත සමස්ත ක්‍රියාවලියට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන මැතිවරණ කොමිසම විසින් සකසා ගැනීම. | මැතිවරණ කොමිෂන් සභාව |
| 49 | ජංගම දුරකථන සේවා පාරිභෝගික ලියාපදිංචිය, පාරිභෝගික දත්ත රැස්කිරීම, ගබඩා කර තැබීම, විධිමත් කිරීම හා නියාමනය සිදු කිරීම. ඒ සම්බන්ධ නීති රීති හා දණ්ඩන පිළිබඳව මහජනයා දැනුවත්කිරීම TRCSL වෙතින් සිදු කිරීම. | තාක්ෂණ අමාත්‍යාංශය - TRCSL |
| 50 | ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි ලෙස විද්‍යුත් සංදේශ පද්ධතිය අවභාවිතා කිරීම අපෙදෙයියට පත් කිරීම. එය වැළැක්වීමට නීතිය ක්‍රියාත්මක කරන ආයතන වෙත අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා මධ්‍යගත තොරතුරු මධ්‍යස්ථානයක් TRCSL යටතේ පිහිටුවීම. | තාක්ෂණ අමාත්‍යාංශය - TRCSL |
| 51 | ශ්‍රී ලංකාවට පැමිණීමට අපේක්ෂා කරන අයවළුන්ගේ තොරතුරු ඔවුන් පැමිණීමට පෙර ලබා ගෙන ශ්‍රී ලංකාවට තර්ජනයක් විය හැකි මගීන් හඳුනා ගැනීමට වැඩ පිළිවෙලක් ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් සැකසීම. | ආරක්ෂක අමාත්‍යාංශය හා ආගමන විගමන දෙපාර්තමේන්තුව |
| 52 | ආගමික කටයුතු අමාත්‍යාංශය සෑම විටම ජනාධිපතිවරයා හෝ අගමැති වරයා යටතේ තබා ගැනීම හෝ එසේ නොමැති වූ විට සියළු පාර්ශවයන්ගේ ගෞරවයට පාත්‍ර වූ ජ්‍යෙෂ්ඨ කැබිනට් අමාත්‍යවරයෙකු යටතේ තබා ගැනීම. | ජනාධිපති ලේකම් කාර්යාලය |
| 53 | දැනට ලියාපදිංචි කර නොමැති එහෙත් ජන පදනමක් සහිතව යම් කාලයක් පවත්වාගෙන යනු ලබන ආගමික ස්ථාන ලියාපදිංචියේදී එම ස්ථානයේ පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික සාධක කෙරෙහි විශේෂ සැළකිල්ලක් දැක්වීම හා එහිදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ හා නිර්දේශ ලබාගෙන ඒ මත ලියාපදිංචිය සිදු කිරීම. | බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |
| 54 | යම් ආගමික ස්ථානයක් ඉදිකිරීමේදී විදේශ මුදල් ඊට ලැබේ නම්, රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයේ හා අදාල ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ නිසි මූල්‍ය විනයකට හා පාරදෘශ්‍ය විගණණයකට එය ලක්කිරීම. | බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |



රහසයි

| අංකය | යෝජනාව | වගකීම දරන ආයතනය |
| --- | --- | --- |
| 55 | නව ආගමික මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා වන මූලික අනුමැතිය ලබා ගැනීමේදී අදාළ ආගම අදහන ආගමික කණ්ඩායමේ ජන සංඛ්‍යාව, ජන ඝනත්වය හා ඊට ඇති අවශ්‍යතාවය එම අනුමැතිය ලබාදෙන ආයතනයේ තක්සේරුවට ලක්කිරීම. | බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |
| 56 | (පොදු ජාතික ප්‍රමිතිකරණ ක්‍රියාවලියට අමතරව හලාල් සහතිකය ලබාදීමද දිගටම පවත්වාගෙන යන්නේ නම්) හලාල් ප්‍රතීතන කවුන්සිලයේ කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම හා කළමණාකරණය කිරීමට එකඟතාව දැක්වූ පසු රජයේ විගණන නිලධාරීන් විසින් එහි මෙහෙයුම් සම්බන්ධයෙන් ස්වාධීන විගණනය සිදු කිරීම. | වෙළඳ අමාත්‍යාංශය |
| 57 | සමාගමක් හලාල් සහතිකය ලබාගත් පසු එම සමාගම / භෝජනාගාරය සතුව, පාරිභෝගිකයාට හලාල් සහතිකය සහිත හෝ රහිත එකම නිෂ්පාදනය සිය රුචිකත්වය අනුව තෝරා ගැනීමට හැකිවන පරිදි භාණ්ඩ වෙන් වෙන්ව තබා මිළදී ගැනීමට පහසුකම් සැලසීම. | වෙළඳ අමාත්‍යාංශය |